## සංශෝධනයයි

## විගණන සේවා කොමිෂන් සභාව

## ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත සේවා ගණයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට බඳවාගැනීමේ විවෘත තරග විභාගය - 2026

අංක 2506 දරන 2026.09.11 දිනැති ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *ගැසට් පත්‍රයේ* පළකරන ලද "ශ්‍රී ලංකා රාජ්‍ය විගණන සේවයේ ක්ෂේත්‍රගත/ කාර්යාලගත සේවා ගණයේ III පන්තියේ II ශ්‍රේණියේ විගණන නිලධාරි තනතුරට බඳවා ගැනීමේ විවෘත තරඟ විභාගය - 2026" සඳහා වන විභාග නිවේදනයේ අනු අංක 04 හි සුදුසුකම් යටතේ දක්වා ඇති (ii) වයස සම්බන්ධයෙන් වන වගන්තිය පහත පරිදි සංශෝධනය කෙරේ.

"අයදුම්පත් කැඳවීමේ අවසන් දිනට වයස අවුරුදු 22ට නොඅඩු හා වයස අවුරුදු 35 ට නොවැඩි විය යුතු ය."

02. මෙම බඳවාගැනීම සඳහා අයදුම්කරුවන් සුදුසුකම් සම්පූර්ණ කළයුතු දිනය මෙමගින් සංශෝධනය නොකෙරේ. ඒ අනුව

බඳවාගැනීම සඳහා සලකා බලනු ලබන සියලුම සුදුසුකම් මුල් අයදුම්පත් කැඳවීමේ නිවේදනයෙහි දක්වා ඇති 2026 ඔක්තෝබර් 12 දිනට සපුරා තිබිය යුතු ය.

03. තව ද, 2026.09.11 දිනැති අයදුම්පත් කැඳවීමේ නිවේදනයේ සඳහන් අනෙකුත් සියලු විධි විධාන එලෙසින්ම බල පැවැත්වෙන අතර, මෙම සංශෝධනය හේතුවෙන් අයදුම්පත් භාරගැනීමේ අවසාන දිනය 2026 නොවැම්බර් මස 12 දින දක්වා දීර්ඝ කරනු ලැබේ.

04. මෙම විභාගය සඳහා දැනටමත් අයදුම්කර ඇති අයදුම්කරුවන් නැවත අයදුම්පත් යොමු කිරීම අවශ්‍ය නොවේ.

විගණන සේවා කොමිෂන් සභාවේ නියමය පරිදි,

**ඩී. කේ. විජේසිංහ,**
ලේකම්,
විගණන සේවා කොමිෂන් සභාව.

10 - 409